2 වන වෙළුම 4 වන කලාපය 2009, අප්‍රේල්

# කැඩපත

දැනුම ඔප් නංවනු එක්

## මෙවර කලාපයෙන්



මනා පෝෂණය හා අපගේ දරු පරපුර



අලුත් පොත්!



# මනා පෝෂණය හා අපගේ දරු පරපුර

පෝෂණය යන වදනින් අදහස් වන්නේ කුමක් දැයි ඇසූ විට හොඳ ආහාර ගැනීම එයින් අදහස්වන බව ඕනෑම කෙනෙක් පවසනු ඇත. ඉක්මණින් ලොකු මහත් වීමට ඕනෑ නම් ඇති තරම් එළවලු කෑම හා කිරි බීම කළ යුතු බව ළමා කාලයේ දී නො ඇසූ කෙනෙක් නැත. මෙය සියලු දෙනාම දන්නා හුරු පුරුදු මතයක් වුවත් පෝෂණය හුදෙක් හැදී වැඩීමට වඩා ඔබ්බට යන සංකල්පයකි. එය මානසික යහ-පැවැත්ම, පාසැල් ක්‍රියාකාරකම්, ඉක්මණින් තුවාල සුව වීමට, ලෙඩ රෝග වැළැඳීමේ අවදානම අවම කිරීමට මෙන් ම ලෙඩ රෝගවලින් ඉක්මණ් සුවය ලැබීමේ හැකියාව වැඩි කිරීම හා සම්බන්ධ වේ. ජීවිතයේ මුල් වසර පහ තුළ මනා පෝෂණයක් ලැබීම අවශ්‍යවන්නේ මේ නිසාය. එහෙත් අවාසනාවන්ත තත්වය වන්නේ සියලුම දරුවන්ට මනා පෝෂණයක් ලැබීමේ හැකියාවක් නොමැති වීමයි. සංවර්ධනය වෙමින් පවතින රටවල දරුවන්ගෙන් තුනෙක් එකක ප්‍රමාණයක් මන්ද පෝෂණයෙන් පෙලෙන අතර මිලියන 150කට අධික ප්‍රමාණය දරුවන්ගේ වයසට සාපේක්ෂව නියමිත බර නොපවතියි. මන්දපෝෂණය යන්න නිසියාකාර ලෙස පෝෂණය නොලැබීම සේ නිර්වචනය කළ හැකි අතර මෙයට හේතු වන්නේ අවශ්‍ය ප්‍රමාණයට ආහාර නොමැති වීම පමණක් නොවේ. ප්‍රමාණවත් ලෙස ප්‍රෝටීන්, ශක්තිමය හා සුළු පෝෂක අවශ්‍යතා නොලැබීම, නිරන්තරයෙන් ලෙඩ රෝගවලට ගොදුරු වීම, දුර්වල සෞඛ්‍යාරක්ෂක හා ආහාර ගැනීමේ පුරුදු, ප්‍රමාණවත් නොවන සෞඛ්‍ය පහසුකම් මෙන් ම අනාරක්ෂිත ජල හා සනීපාරක්ෂක පහසුකම් නොමැති වීම ආදී හේතු රාශියක් මන්දපෝෂණයට බලපායි.

මන්ද පෝෂණය ශ්‍රී ලංකාවේ දරුවන් අතර ද පවත්නා බරපතල සෞඛ්‍ය ගැටලුවක් සේ සැලකිය හැකි වේ. මෑත කාලීනයේ දී කරන ලද ජනගහන හා සෞඛ්‍ය හා සමීක්ෂණයකට (DHS 2006/7) අනුව හෙළි වූයේ ශ්‍රී ලංකාවේ අවුරුදු පහට අඩු දරුවන්ගෙන් 22% ප්‍රමාණයකට වයසට නියමිත බර නොමැති බවයි. එසේ ම 18% ප්‍රමාණයක් මිටි භාවයෙන් පෙළෙන බවත් 15% ප්‍රමාණයක් බරට අනුව උස අනුපාතිකයෙහි ලා සලකන විට ප්‍රමාණයට වඩා කෙසඟ බවත් අනාවරණය විය.

ADRA ශ්‍රී ලංකා ආයතනය මගින් සියලුම දරුවන්ට ලබා ගත හැකි උපරිම සෞඛ්‍ය මට්ටම ලබා ගැනීමේ අයිතිවාසිකම හඳුනාගෙන සිටියි. මනා පෝෂණයක් ලැබීම මෙහිදී වඩාත් වැදගත් වේ. මේ අනුව බාහිර අංගෝපාංග ගැන පමණක් නොසලකමින් තිරසාර ප්‍රජා සහභාගීත්ව කුසලතා හා වටිනා ප්‍රාදේශීය දැනුම හා සම්පත් පිළිබඳ අවධාරණය කරමින් ගුණාත්මක උපාය මාර්ග මත පදනම් වූ ක්‍රමවේදයකට *මනා පෝෂණය හා...* අනුව සැකසුණු වැඩසටහනක් ADRA ශ්‍රී ලංකා ආයතනය මගින් දියත් කරනු ලැබ ඇත්තේ එබැවිනි.

HEARTH ව්‍යාපෘතිය අම්පාර

*(සිව්වන පිටුවට...)*

# අවතැන්වූවන්ට සහනයක් වූ නෝර්වේජියානු සරණාගත කවුන්සලය

නෝර්වීජියානු සරණාගත කවුන්සිලය, 2004 වර්ෂයේ මුල් භාගයේ ශ්‍රී ලංකාව තුළ සිය කටයුතු ආරම්භ කළේය. ඔවුන් විසින් මේ දක්වා උතුරු නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් අවතැන් වූවන්ට මෙන් ම 2004 දෙසැම්බර් මාසයේ ඇති වූ සුනාමි ව්‍යසනයෙන් අවතැන්වූවන්ට මානුෂීය සහන සපයා තිබේ. නෝර්වීජියානු සරණාගත කවුන්සිලය අභ්‍යන්තරව අවතැන්වූවන්ට ආධාර සපයයි. එමෙන් ම අභ්‍යන්තර අවතැන්වූවන් යළි සිය ප්‍රජාව හා අනුගත වීමේ කාර්යයේ දී සම්බන්ධීකරණය හා නිවාස සැපයීම, තොරතුරු, උපදේශනය හා නීති උපදෙස් ලබා දීම (ICLA), කඳවුරු කළමණාකරණය හා ආරක්ෂාව නිරීක්ෂණය කිරීම ආදී අංශවලින් ආධාර සපයමින් සිටියි. මේ සංවිධානයේ මූලස්ථානය කොළඹ පිහිටා ඇති අතර දිස්ත්‍රික්ක හයක් පුරා සිය කටයුතු සිදු කරමින් සිටියි. වව්නියාව, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර හා පුත්තලම යන ප්‍රදේශවල ක්ෂේත්‍ර කාර්යාල ස්ථාපනය කර ඇත. සුනාමි ව්‍යසනය අවස්ථාවේ දී අනුරාධපුරය ගාල්ලේ හා යාපනයේ ද ක්ෂේත්‍ර කාර්යාල ස්ථාපනය කර තිබිණි.

නෝර්වීජියානු සරණාගත කවුන්සිලය ශ්‍රී ලංකාව තුළ සහන සැපයීමේ මුල් පියවරක් සේ නිවාස සැපයීමේ වැඩසටහනක් ආරම්භ කර තිබිණි. මෙහිදී 2002 ඇති වූ සටන් විරාම ගිවිසුමෙන් පසුව සිය ගම්බිම් කරා ආපසු පැමිණෙමින් සිටි අභ්‍යන්තර අවතැන්වූවන්ට ස්ථිර නිවාස ලබා දීම සිදු විය. ඉන්පසු දීර්ඝ කාලයක් තිසේසේ ඉඩම්වලින් බැහැර වී සිටීම හා ලියකියවිලි අස්ථානගත වීම නිසා සිය ඉඩම්වලට හිමිකාරීත්වය තහවුරු කිරීමේ ගැටලුවලට මුහුණ පා සිටි අභ්‍යන්තර අවතැන් වූවන්ට උපකාර කරන ව්‍යාපෘතියක් ආරම්භ විය. සුනාමි ව්‍යසනයෙන් පසු සංවිධානයේ කාර්යභාරය ට හදිසි අවස්ථාවලට ප්‍රතිචාර දැක්වීම හා පසු සුනාමි අවශ්‍යතාවලට ප්‍රතිචාර දැක්වීම ද ඇතුළත් විය. අධ්‍යාපනය, ගුරුවරු පුහුණු කිරීම, පාසැල් ප්‍රතිසංස්කරණය හා නැවත ගොඩනැගීම, කඳවුරු කළමණාකරණ පුහුණුව, ආදී අතිරේක ව්‍යාපෘති මේ කාල සීමාව තුළ ආරම්භ විය.

නෝර්වීජියානු සරණාගත කවුන්සිලය උතුරේ අර්බුද පවතින ප්‍රදේශවල සිට වව්නියාව කරා ඇදී එන අභ්‍යන්තර අවතැන්වූවන්ට සහන සැපයීමේ කාර්යයේ දී රජයට සිය සහයෝගය දක්වමින් සිටියි. නොර්වීජියානු සරණාගත කවුන්සිලය මගින් වව්නියාවේ හුවමාරු ප්‍රදේශවල හදිසි අවස්ථා සඳහා උපයෝගී කරගත හැකි නිවාස 240ත් තනා ඇති අතර, අභ්‍යන්තර අවතැන්වූවන් වෙනුවෙන් අලුතින් වෙන් කර ඇති ප්‍රදේශයක තවත් නිවාස 320 සෑදීමට අපේක්ෂා කරයි. අවශ්‍යතාවලට අනුව තවත් නිවාස ඉදි කිරීම සිදු වනු ඇත. ආහාර නොවන ද්‍රව්‍ය ඇතුලත් ගෘහස්ත කට්ටල 1008ත් වව්නියාවට පැමිණෙන පවුල් අතර බෙදා හැර ඇති අතර තවත් කට්ටල 1000 බෙදා දීමට නියමිතය. නෝර්වීජියානු සරණාගත කවුන්සිලයේ ආරක්ෂන හා නිරීක්ෂක කණ්ඩායම් ආධාර සැපයීමේ ක්‍රියාවලියේ ඇති වී ඇති හිස්තැන් හා අඩුපාඩු පිළිබඳ සොයා බලා ඒ සම්බන්ධයෙන් රජය හා සෙසු ආධාර සැපයීමේ ක්‍රියාවලියේ යෙදී සිටින පාර්ශ්ව දැනුවත් කිරීම සඳහා නිතර නිතර අභ්‍යන්තර අවතැන්වූවන් රැඳී සිටින ප්‍රදේශවලට යාම සිදු කරයි.

රාජ්‍ය ආයතන හා සෙසු ආයතනවල සහයෝගීතාව ඇති ව නෝර්වීජියානු සරණාගත කවුන්සිලය විසින් සිදු කරගෙන යන ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

**නිවාස සැපයීම හා සම්බන්ධීකරණය**

නිවාස සැපයීම නෝර්වීජියානු සරණාගත කවුන්සිලයේ ප්‍රධාන ව්‍යාපෘතියක් වේ. දැනට නොර්වීජියානු සරණාගත කවුන්සිලය, වව්නියාවට පැමිණෙමින් සිටින අභ්‍යන්තර අවතැන්වූවන් ට නිවාස හා ආහාර නොවන ද්‍රව්‍ය වලින් සමන්විත ගෘහස්ත කට්ටල සපයමින් සිටියි. මඩකලපුව හා ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවලත් යුද්ධයෙන් පීඩාවට පත් වූ අභ්‍යන්තර අවතැන් වූවන්ට නිවාස සැපයීමේ කටයුතු දිගටම සිදු වේ. මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ආපසු පැමිණෙමින් සිටින අභ්‍යන්තර අවතැන්වූවන් වෙනුවෙන් තාවකාලික නිවාස සැපයීමක් ද සිදු කෙරේ.

**තොරතුරු, උපදේශනය හා නීතිමය උපදෙස් ලබා දීම (ICLA)**

ICLA ව්‍යාපෘතිය 2005 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර මෙය ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මකවන විශාල ම නීති ව්‍යාපෘතියක් සේ සැලකිය හැකිය. මෙහිදී ජාතික හා අන්තර්ජාතික නීති උපදේශකයන් විසින් නීති උපදෙස් ලබා දීම සිදු කරන අතර අම්පාර, මඩකලපුව, ත්‍රිකුණාමලය, වව්නියාව හා පුත්තලම යන ප්‍රදේශයන් හි කාර්යාල ස්ථාපනය කර ඇත. 2009 ජනවාරි මාසය වන විට ICLA වෙත ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව 50000 කට අධික වූ අතර මෙයින් 95ක් ම සිවිල් ලියකියවිලි හා ඉඩම් හා දේපළ සම්බන්ධ ඒවා විය. මෙම වැඩසටහන රාජ්‍ය ලියාපදිංචි කිරීමේ කාර්යාල හා සමීපව කටයුතු කරයි.

**කඳවුරු කළමණාකරණය**

ශ්‍රී ලංකාව තුළ රාජ්‍ය බලධාරීන්ට, රාජ්‍ය නොව සංවිධානවල කාර්ය මණ්ඩලවලට, අභ්‍යන්තර අවතැන්

*(සිව්වන පිටුවට...)*

**කාර්යභාරය**

නෝර්වීජියානු සරණාගත කවුන්සිලය, කිසියම් හේතුවක් නිසා සිය රටින් හෝ සිය රට තුළ සිය නිවෙස්වලින් පලා යෑමට සිදු වූ පුද්ගලයින්ට ඔවුන්ගේ ජාතිය, ආගම හෝ දේශපාලන මතිමතාන්තර බැහැර කරමින් ඔවුන්ගේ අයිතීන් සුරැකීමට බැඳී සිටියි.
නෝර්වීජියානු සරණාගත කවුන්සිලය සිය මූලික කාර්යභාරයේ දී මෙන් ම හදිසි අවස්ථාවල දී සහන සැපයීමේ දීද සාර්ථක හා දීර්ඝ කාලීන විසඳුම ලබා දීම සිය අරමුණ කර ගෙන සිටියි.

# අලුත් පොත්!

**CHA හි කොළඹ දැනුම මධ්‍යස්ථානයෙන් මෙම නව ප්‍රකාශන ලබා ගත හැකිය.**




**Barrier Free Access Handbook**

ස්ටෑන්ඩඩ් චාටඩ් බැංකුවේ ප්‍රකාශනයකි
වඩාත් පරිපූර්ණ පරිසරයක් තැනීමෙහි ලා උනන්දුවක් දක්වන පුද්ගලයින් වෙනුවෙන් වන උපදේශනාත්මක කෘතියකි. මෙය සම්පාදනය කිරීමේ දී දැනට පවතින ව්‍යවස්ථාව, රීති හා සම්මතයන් සැලකිල්ලට ගෙන තිබේ.




අඳුර විනිවිද

ශ්‍රී ලංකාවේ ජනවාර්ගික අර්බුදය පිළිබඳ විශ්ලේෂණයක් 2006-2008
ජෙහාන් පෙරේරා

*A dove sits on my Shoulder* හි සිංහල පරිවර්තනය




**Assistive Technology**
**For People with Disabilities**
Brayant, Brian R විසිනි

මෙහිදී උපකාරක තාක්ෂණික ක්‍රම සම්බන්ධයෙන් පාඨකයාට වැඩිදුර තොරතුරු ලබා දීම අරමුණු කරගෙන ඇත. මෙම කෘතියේ දී උපකරණ හා සේවාවන්ට වැඩි සැලකිල්ලක් දක්වා තිබේ.
මූලික අරමුණු :
ප්‍රධාන උපකාරක තාක්ෂණික යෙදුම් නිර්වචනයන් විභාග කිරීම
උපකාරක තාක්ෂණයේ ඉතිහාසය පිළිබඳ දැනුම ප්‍රදර්ශනය කිරීම
උපකාරක සේවා සැපයීම් සම්බන්ධයෙන් කටයුතු කරන ප්‍රධාන වෘත්තිකයන් හඳුනා ගැනීම




**Language Rights in Sri Lanka**
Enforcing Tamil as an
Official language
සංස්කරණය: බී ස්කන්දකුමාර්
මෙහි සිංහල හා දෙමළ පරිවර්තනයන්ද ලබා ගත හැකිය.




**GSP+ and Sri Lanka:**
Economic, Labor and human Rights Issues
ප්‍රකාශනය CPA හා FES
ශ්‍රී ලංකාව අනුග්‍රාහකයෙක් සේ වැඩි දියුණු කිරීම පිළිබඳ සංදර්භයේ දී සංස්ථිතිමය මැදිහත් වීමක් සම්බන්ධයෙන් මෙම කෘතියේ තොරතුරු ඇතුළත් වී තිබේ.




මෙය කතා පුවත් එකතුවකි.
(සංයුක්ත තැටිය)
ප්‍රකාශනය **FCM** හා **MCP**




17වන සංශෝධනය
විශ්ලේශණාත්මක ලිපි (සිංහල)
ප්‍රකාශනය
ජාතික සාම කවුන්සිලය

17වන සංශෝධනය
විශ්ලේශණාත්මක ලිපි (දෙමළ)
ප්‍රකාශනය
ජාතික සාම කවුන්සිලය

මේ ප්‍රකාශන පිළිබඳ වැඩිදුර තොරතුරු සඳහා තොරතුරු විශ්ලේෂක විමසන්න.


ලලිත් සමරවීර
මානුෂීය සේවායතන සමූහය
infoanalyst@cha.lk
0114 610943 -129

පළමු පිටුවෙන්...



දිස්ත්‍රික්කයේ පොතුවිල් කොට්ඨාශයේ ක්‍රියාත්මක වෙමින් ඇත. මේ මගින් සුනාමියෙන් ඍජුව හෝ වක්‍රව විපතට පත් පවුල්වල මව්වරුන් හා දරුවන් මෙන් ම දැනට රටේ පවතින දේශපාලනික අස්ථාවරභාවය නිසා විපතට පත්ව සිටින පවුල්වල මව්වරුන් හා දරුවන් අරමුණු කරගෙන ඇත. HEARTH ව්‍යාපෘතියේ සැසිවාරයන් 12කි. මෙහිදී මව්වරුන්ට ප්‍රාදේශිය දැනුම පදනම් කර ගත් යහපත් සෞඛ්‍ය පුරුදු හා මනා පෝෂණය සම්බන්ධයෙන් අධ්‍යාපනයක් ලබා දිම සිදු වේ. ව්‍යාපෘතියේ පසුබිම, එහි ඇතුළත් වී ඇති කරුණු, වෙළඳපළ සමීක්ෂණයක් ස්වේච්ඡා මව්වරුන් පුහුණු කිරීම, ආහාර ලබා දීමේ මධ්‍යස්ථාන සංවිධානය කිරීම, දරුවන්ගේ බර කිරීම හා ආහාර සෑදීම ආදිය ද මෙයට ඇතුළත් වේ. ස්වේච්ඡා සේවකයින් විසින් නිවෙස්වලට පැමිණ නිරීක්ෂණ කටයුතු සිදු කෙරෙනු ඇත. මෙහි එක් පියවරක් ලෙස ආහාර සැපයීමේ මාර්ගයක් සේ ගෙවතු වගා දිරිමත් කිරීම සිදුවේ. ගෙවතු වගාව ශ්‍රී ලංකාවට නුපුරුදු දෙයක් නොවන අතර මේ ව්‍යාපෘතියේ අරමුණ වන්නේ ගෙවතු වගාවලින් ලැබෙන ලාභයට අමතරව එයින් ලැබිය හැකි පෝෂණය පිළිබඳව අවධානය යොමු කරවීමයි.

ඇත්තෙන් ම මෙය සුවිශාල කාර්යයකි. එහෙත් මනා පෝෂණයක් ලබා ගැනීමට දරුවන්ට ඇති අයිතිවාසිකම සියලුම රජයන් හා රාජ්‍ය නොවන සංවිධාන විසින හඳුනාගෙන තහවුරු කළ යුතු වේ. මනා පෝෂණයක් සහිත දරු පරපුර, සෞඛ්‍ය සම්පන්න හා ඵලදායී සමාජයක මූලාරම්භය වනු ඇත. එය අපගේ පැවැත්මේ අරමුණයි.

**මිල්ඩ්‍රඩ් කැස්ටිලෝ**
**මහජන සම්බන්ධතා හා සන්නිවේදන නිලධාරී**
**ADRA ශ්‍රී ලංකා**
37, පුරාණ පාර, වත්තේගෙදර,
මහරගම, ශ්‍රී ලංකා
**millie@adrasrilanka.org**

දෙවන පිටුවෙන්...

වූවන්ගේ කමිටුවලට හා ෂත්කාරක ප්‍රජාවන්ට කඳවුරු කළමණාකරණය පිළිබඳ පුහුණුවක් ලබා දෙන එක ම සංවිධානය සේ නොර්වීජියානු සරණාගත කවුන්සිලය දැක්විය හැකිය. අන්තර්ජාතික ප්‍රමිතීන් යටතේ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ කඳවුරු පවත්වාගෙන යමින් උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල අවතැන් වී සිටින ජනතාව කාර්යක්ෂම හා කඩිනම් සේවා සැපයිම මෙහි අරමුණයි.

**අභ්‍යන්තර අවතැන්වූවන් වෙනුවෙන් ආරක්ෂාව නිරීක්ෂන වැඩසටහන්**

වව්නියාව, මඩකලපුව හා ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මකවන අන්තර්ජාතික ආරක්ෂක උපදේශකයින් විසින් දියත් කෙරෙන වැඩසටහන් මගින් අභ්‍යන්තර අවතැන්වූවන්ට අවතැන් වූ සමයේ හා නැවත පැමිණීමේ දී ඔවුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් දැනුවත්භාවයක් ලබා දීම සිදු වේ.

නෝර්වීජියානු සරණාගත කවුන්සිලය ස්වාධීන මානුෂීය සේවා සංවිධානයක් වන අතර සරණාගතයින්ට හා අභ්‍යන්තර අවතැන්වූවන්ට වඩාත් ආරක්ෂිත හා ගෞරවනීය ජීවන තත්ත්වයක් ලබා දිම උදෙසා වසර 60 කට අධික කාලයක් ඇප කැප වී කටයුතු කර ඇත. මේ සංවිධානය ලොව පුරා රටවල් 20 අධික සංඛ්‍යාවක් තුළ අභ්‍යන්තර අවතැන්වූවන්ගේ අයිතිවාසිකම් සුරැකීමට, ආහාර සම්බන්ධයෙන් උපකාර සැපයීමට, නිවාස හා අධ්‍යාපනය සම්බන්ධයෙන් උපදේශන ලබා දීමට මෙන් ම නීති උපදෙස් ලබා දීමට ද කටයුතු කරමින් සිටියි. නෝර්වීජියානු සරණාගත කවුන්සිලය කිසිම ආගමික හෝ දේශපාලනික සහයෝගීත්වයක් නොමැති ස්වාධීන පෞද්ගලික නෝර්වීජියානු පදනමක් වේ.

**නෝර්වේජියානු සරණාගත කවුන්සලය**

*ඔබ වෙනුවෙන් ම වූ මෙම පුවත් සඟරාව පිළිබඳ ඔබගේ අදහස්, යෝජනා හා ලිපි අපි අගය කොට සලකමු.*

**මානුෂීය සේවායතන සමූහය**
අංක 86
රොස්මිඩ් පෙදෙස
කොළඹ 7
දුරකථන: 011 4610943/4
ඊමේල්: feedback@cha.lk
වෙබ් අඩවිය : www.humanitarian-srilanka.org

CONSORTIUM OF HUMANITARIAN AGENCIES (GTE) LIMITED